**ශීර්ෂය 216 - සමාජ සේවා දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2016 වර්ෂය**

ශීර්ෂය 216 - සමාජ සේවා දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 සැප්තැම්බර් 29 දින දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන් වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම**

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 496.44 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 483.82 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 12.62 ක් හෙවත් සියයට 2.54 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2016 දෙසැම්බර් 31දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 446.34 | 434.93 | 11.41 | 2.56 |
| මූලධන | 50.10 | 48. 89 | 1.21 | 2.42 |
| **එකතුව** | **496.44** | **483.82** | **12.62** | **2.54** |

## 2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

### පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්

දෙපාර්තමේන්තුවට අදාළ විෂය අංක 21601 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 16.50 | 14.58 | 14. 50 | 17.42 | 75.00 | 50.77 |

## 2.3 විගණන නිරීක්ෂණය

සමාජ සේවා දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

සමාජ සේවා දෙපාර්තමේන්තුව විසින් 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි.

### 3.2 විසර්ජන ගිණුම

#### 3.2.1 අයවැය විචලනය

දෙපාර්තමේන්තුව විසින් නිවැරදිව අයවැය ඇස්තමේන්තු නොකිරීම නිසා වැය විෂයයන් 10 ක් සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනයන් කළ පසු ඉතිරිය සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 11 ක සිට සියයට 81 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

### 3.2.2 සලසා තිබුණු ප්‍රතිපාදනයන් ඉක්මවා බැරකම්වලට එළඹීම

මුදල් රෙගුලාසි 94(1) ට පටහැනිව වැය විෂයයන් 13 ක් සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු ඉතිරිය ඉක්මවා එකතුව රු.2,523,596 ක බැරකම්වලට එළඹ තිබුණි.

### 3.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විෂය අංක 21601 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2016 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු. 811,862 ක්වූ අතර, එම හිඟහිටි ණය ශේෂ වර්ෂ 01 ක සිට වර්ෂ 21 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

### 3.4 අනුකූල නොවීම්

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| මුදල් රෙගුලාසි 752(2) | සමාජ සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය හා වෘත්තීය පුහුණු ආයතනවල 2016 වර්ෂය අවසානයේ සිදු කළ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවලින් අනාවරණය වූ අයිතම් 1088 ක ඌනතා පිළිබඳව සඳහන් කර තිබුණු නිර්දේශ ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| **(ආ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය** | |
| 4.2.1 (ආ) හා (ඇ) මාර්ගෝපදේශ | ආයතනය විසින් අවම වශයෙන් ඉදිරි වර්ෂ 03 ක කාලයක් සඳහා අපේක්ෂිත සියළු මිලදීගැනීම් ඇතුළත්ව විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබුණි. |

## 3.5 කාර්යසාධනය

2016 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

### (අ) ප්‍රමාණවත් ලෙස ඉටුනොකළ ප්‍රධාන කාර්යයන්

දෙපාර්තමේන්තුව විසින් ප්‍රධාන කාර්යයන් ප්‍රමාණවත් ලෙස ඉටු නොකර තිබුණු අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(i) සමාලෝචිත වර්ෂයේදී ආබාධිත තරුණ තරුණියන් 700 කට වෘත්තීය පුහුණුව ලබාදීමටත් අභ්‍යාසලාභීන් 700 දෙනෙකු සඳහා දීමනා ලබාදීමටත් සැලසුම් කර තිබුණද පිළිවෙලින් පුද්ගලයින් 314 දෙනෙකුට වෘත්තීය පුහුණුවත් අභ්‍යාසලාභීන් 577 දෙනෙකුට දීමනා ලබාදීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

(ii) නාවින්න ළමා මාර්ගෝපදේශ මධ්‍යස්ථානයෙන් විශේෂ අවශ්‍යතා ඇති ළමුන් 120 ක් සඳහා සේවා සැපයීමට සැලසුම් කර තිබුණි. නමුත් ළමුන් 98 දෙනෙකු පමණක් ලියාපදිංචි වී තිබුණි

(iii) ඉහත සඳහන් පරිදි බඳවාගත් ළමයින් 98 දෙනාගෙන් ළමුන් 21 දෙනෙකු පාසල්වලට යොමු කිරීමත්, ළමුන් 15 දෙනෙකු පෙර පාසල්වලට අන්තර්කරණය කිරීමත් කර තිබුණි. කෙසේ නමුදු ඉතිරි ළමුන් 62 දෙනෙකු එකී අවස්ථා දෙකෙන් කිසිවකට හෝ යොමු කර නොතිබුණි.

(iv) වෘත්තීය පුහුණුව නිමකළ අභ්‍යාසලාභීන් 250 දෙනෙකු සඳහා රු.20,000 බැගින් රු.5,000,000 ක මෙවලම් කට්ටල ලබාදීමට සැලැසුම් කර තිබුණි. අභ්‍යාසලාභීන් 219 දෙනෙකු සඳහා පමණක් රු.3,800,000 ක් වැයකර මෙවලම් කට්ටල ලබාදී තිබුණි. ඒ අනුව අභ්‍යාසලාභීන් 31 දෙනෙකුට මෙවලම් කට්ටල ලබාදී නොතිබුණු අතර සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් රු.1,200,000 ක් වර්ෂය අවසානය වන විටත් ඉතිරි කර තිබුණි.

(v) ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන 02 ක් නඩත්තු කිරීම සඳහා මූල්‍යාධාර සැපයීමට රු.100,000 ක ප්‍රතිපාදන සලසා තිබුණද, අදාළ සංවිධාන දෙක සඳහා මූල්‍යාධාර වශයෙන් ලබාදී තිබු ප්‍රතිපාදනයෙන් රු.30,000 ක් ඉතිරි කර තිබුණි.

(vi) විශේෂ අවශ්‍යතා ඇති ළමුන් සඳහා රත්නපුර ප්‍රදේශයේ පිහිටුවා ඇති ළමා මාර්ගෝපදේශ මධ්‍යස්ථානයේ ළමුන් 75 දෙනෙකු සඳහා ලිපිද්‍රව්‍ය, කථන ද්‍රව්‍ය සහ ප්‍රවාහන දීමනා සඳහා රු.400,000 ක ප්‍රතිපාදන සලසා තිබුණි. කෙසේ වුවද, ඒ එක් එක් අවශ්‍යතා සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනය හා උපයෝජනය කළ ප්‍රමාණය පිළිබඳ තොරතුරු වෙන් වෙන් වශයෙන් වාර්තාවේ ඇතුළත් කර නොතිබුණි.

(vii) සමාලෝචිත වර්ෂයේදී දෙපාර්තමේන්තුව යටතේ පවත්වාගෙන යනු ලබන වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන 08 ක් සඳහා ළමුන් 510 දෙනෙකු බඳවා ගැනීමට සැලැසුම් කර තිබුණද, ළමුන් 386 දෙනෙකු පමණක් බඳවා ගෙන තිබුණි.

(viii) කාර්යාල නිලධාරින් සඳහා සංඥා භාෂා පුහුණු වැඩසටහන් සඳහා දෙපාර්තමේන්තුව විසින් නිශ්චිත සැලැසුමක් සකස්කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී පැවැත්විය යුතු පුහුණු වැඩසටහන් සංඛ්‍යාවද, කාර්යසාධන සැලැසුමට ඇතුළත් කර නොතිබුණි. ඒ හේතුවෙන් එම පුහුණු වැඩසටහන්වල භෞතික කාර්යසාධනය පිළිබඳ ඇගයීමක් සිදු කර නොතිබුණි.

(ix) දෙපාර්තමේන්තුව විසින් හඳුනාගෙන තිබූ ඉලක්කගත කණ්ඩායම් 21 කින්, පහත සඳහන් කණ්ඩායම් 07 ක් තුළින් මූල්‍ය සහ භෞතික කාර්යසාධනයක් ඉටු කර නොතිබුණි.

යාචකයන් / වීථි දරුවන්
පිළිකා, තැලසීමියා රෝගීන්
ක්ෂය රෝගීන්, ලාදුරු රෝගීන්
බන්ධනාගාරගත වූවන්ගේ පවුල්
අනාථ / අත්හළ පුද්ගලයින්
ජනාධිපති අරමුදලේ නිර්දේශ ඉදිරිපත් කිරීම
විගමනික පවුල්වල සාමාජිකයින්

**(ආ) සැලැසුම් කිරීම**

**-----------------**

**වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව ක්‍රියා නොකිරීම**

**----------------------------------------------------------**

සීදූව වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ ප්‍රවේශ මාර්ග සැකසීමට රු.75,000 ක්ද, සම්බාහන අංශයේ සනීපාරක්ෂක අළුත්වැඩියාවට රු.67,000 ක්ද, කාර්යාලයේ සනීපාරක්ෂක අළුත්වැඩියාවට රු.374,978 ක්ද වශයෙන් රු.516,978 ක් ලබාදී තිබුණද එම කාර්යයන් ඉටු නොකර එම ප්‍රතිපාදන වෙනත් කාර්යයන් සඳහා උපයොජනය කර තිබුණි.

**3.6 කළමනාකරණ දූර්වලතා**

**--------------------------**

සේවයේ යෙදී සිටියදී මියගිය නිලධාරින් 6 දෙනෙකුගේ බාලවයස්කාර දරුවන්ට අයත් රු.177,375 ක බැංකු ඉතිරිකිරීමේ පාස් පොත් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ඔවුන් වෙත නිදහස් කිරීමට කටයුතු කර නොතිබුණි.

**3.7 මානව සම්පත් කළමනාකරණය**

**----------------------------------**

**(අ) අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

**-------------------------------------------------------**

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 11 | 10 | 01 |
| (ii) | තෘතියික මට්ටම | 119 | 115 | 04 |
| (iii) | ද්විතියික මට්ටම | 526 | 477 | 49 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 113 | 105 | 08 |
| (v) | වෙනත් (අනියම් / තාවකාලික / කොන්ත්‍රාත් පදනම) | 18 | 10 | 08 |
| | **එකතුව** | **787** | **717** | **70** |

පහත නිරීක්ෂණය කරනු ලැබේ.

සමාලෝචිත වර්ෂයේදී පැවති වෘත්තීය උපදේශක තනතුරු 18 ක් පුරප්පාඩු වී තිබුණි. පුරප්පාඩු වී තිබුණු එම වෘත්තීය උපදේශක තනතුරු 18 ක් පිරවීමට කටයුතු නොකිරීම නිසා අභ්‍යාසලාභීන් පුහුණු කිරීමේ කටයුතුද අඩාලවීමට සෘජුවම බලපා තිබුණි.

**(ආ) අවිධිමත් ලෙස වෙනත් පාර්ශවයන්ට නිදහස් කළ මානව සම්පත්**

දෙපාර්තමේන්තුව වෙත බඳවාගෙන තිබුණු නිලධාරීන් තිදෙනෙකු රේගු අමාත්‍යාංශය වෙත මුදාහැර තිබුණි. එම නිලධාරීන් වෙනුවෙන් දෙපාර්තමේන්තුව විසින් රු.1,799,918 ක ප්‍රතිපාදන රේගු අමාත්‍යාංශය වෙත නිදහස් කර තිබුණි.